# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,575 — 1958 නොවැම්බර් 3 වැනි සඳුද — 3.11.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ජේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1958 අංක 481**

අ. ආ. කා. C. 162/49 (II).

අධ්‍යාපනඅමාත්‍යාංශයේ ස්ථිර ලේකම් එච්. ජිනදස මහතා දිවයිනට පෙරලා පැමිණෙනතුරු, 1946 යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 51 (1) වෙනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ ඇස්. ඇෆ්. ද සිල්වා මහතා 1958වෙ නොවැම්බර් 1 වෙනි දින සිට ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ලෙස වැඩ බැලීමට පත්කරනු ලැබ සිටී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958වෙ ඔක්තෝබර් 31 වෙනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය.

---

## මිල පාලන දැන්වීම්

**ආර්/13/1958 වෙනි අංක දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය (වියලි මිරිස්)**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් මෙතියස් ස්ටිවන් ක්ලිටස් ගුණවර්ධන වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු මස 23 වෙනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 අගෝස්තු මස 19 වෙනි දින අංක ආර්/10/1958 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 2 වෙනි තීරයෙහි සඳහන් වියලි මිරිස් පිළිබඳව, එම උපලේඛනයේ 3, 4 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 2 වෙනි තීරයෙහි සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩර යක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දැන් පටන්, එහි 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් වියළි මිරිස් පිළිබඳව 1958 අගෝස්තු 23 වෙනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසැට් පත්‍රයේ පළකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු මස 19 වෙනි දින අංක ආර්/10/1958 දරණ මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡේදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ඔක්තෝබර් මස 30 වෙනි දින පස්වරු 2 ට රත්නපුර කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇම්. ඇස්. සී. ගුණවර්ධන,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන,

3267—ජේ. ඇන්. ආර් 26721—4,654 (10/58)

උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>විස්තර | 3 වෙනි තීරය<br>තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වෙනි තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| (1) (අ) රත්නපුර පලාත් ආණ්ඩු සහා ප්‍රදේශය, (ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරලේ පල්ලේ පත්තුව, (ඇ) එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදැනි වසම් හැර කුරුවිට කෝරලේ උඩ පත්තුව සහ කරදන සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදැනි වසම් | වියළි මිරිස් ... | 86 0 ... | 0 87 |
| (2) කලවුවාව නැගෙනහිර ගම්මුලාදැනි වසම හැර කුරුවිට කෝරලේ පල්ලේ පත්තුව සහ කරදන ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරලේ මැද පත්තුව | වියළි මිරිස් ... | 85 75 ... | 0 86 |
| (3) (අ) නවදුන් කෝරලේ උඩ පත්තුව, මැද පත්තුව සහ පල්ලේ පත්තුව (ආ) කුකුළු කෝරලේ මැද පත්තුව | වියළි මිරිස් ... | 86 15 ... | 0 88 |
| (4) (අ) බලන්ගොඩ පලාත් ආණ්ඩු සහා ප්‍රදේශය, (ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය, (ඇ) කුරුවිටි කෝරලේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ, සහ කුඩාව යන ගම්මුලාදැනි වසම්, (ඈ) කල්තොට වසම හැර කඩවත මැද කෝරලේ හෙල පල්ලේ පලාත, හෙල උඩ පලාත සහ උඩුවග්ගම පත්තුව, (ඉ) අටකලං කෝරලේ පන්නිල් පත්තුව, මැද පත්තුව සහ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම, (ඊ) කුකුළු කෝරලේ උඩ පත්තුව සහ ගවරගිරිය ගම්මුලාදැනි වසම | වියළි මිරිස් ... | 86 25 ... | 0 89 |
| (5) (අ) කොලොන්නා කෝරලේ කොළොන්නා ගම් පත්තුව සහ දියපොට ගම් පත්තුව, (ආ) කඩවත කෝරළේ තල්පිටිගම් පත්තුව, (ඇ) අටකලං කෝරලේ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම හැර දෙපත්තුව, (ඈ) මැද කෝරළේ කල්තොට වසම | වියළි මිරිස් ... | 86 50 | 0 90 |

**සැළකිය යුතුය.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**ඇම්.ඇන් 11වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය (වියළි ...**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මන්නාරම් දිස්ත්‍රික්කයේ ආහාර පාලක උප කොමසාරිස් තැන්පත් සන්මුගම් පරමනාදම් වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2 වගන්තිය සමග කියවියයුතු 4වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 සැප්තැම්බර් මස 15 වෙනි දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරණ ලද 1958 සැප්තැම්‍ 13 වෙනි දින අංක 9 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1වෙනි තීරයෙහි සඳහන් වියලි මිරිස් පිළිබඳව එම උපලේ 2, 3 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 1වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩ සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධබර රාත්තලක්ද, මන්නාරම දිස්ත්‍රික්කයේ ස සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් මේ උපලේඛනයේ 2වැනි සහ 3වැනි තීරවල අනු පිළිවෙළින් සඳහ තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයේ 1වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව 1958 සැප්තැම්බර් මස 15 වෙනි දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 සැප්තැම්බර් මස 13 වෙනි දින ඇම්. ඇන්. 9වෙනි මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකිය යුතු ලෙසද මම නියෝග නියම කරමි.

1958 ඔක්තෝබර් මස 30වෙනි දින සවස 3 ට මන්නාරම් කච්චේරියේදී අත්සන් තබන ලදි.

ස. පරමනාදම්
උප මිළ පාලක තැන (අ
මන්නාරම් දිස්ත්‍රික්ක

උපලේඛනය

| 1වැනි තීරය<br>විස්තර | | 2වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | | 3වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|---|
| වියලි මිරිස් | ... ... | 88 49 | ... | 0 88 |

**සැළකිය යුතුය.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

ඇම්. ඇල්. 1958/ඇන්. වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් බන්දුල සෝමසිරි ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 19 වෙනි දින අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරණ ලද, 1958 අගෝස්තු 16 වෙනි දින ඇම්. ඇල්. 1958/කේ දරණ ආහාර මිළ නියෝගයේ 2 වෙනි උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වියළි මිරිස් පිළිබඳ ව, එම උපලෙඛන යෙහි 3 වෙනි සහ 4 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන්, තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති 2 වෙනි උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභොගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, 1 වෙනි උප ලෙඛනයේ පැහැදිලිව දක්වෙන පරිදි මාතලේ පාලන දිස්ත්‍රික්ක සීමාව තුළ විකිණිය හැකි වැඩිම මිළ 2 වෙනි උපලෙඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම 2 වෙනි උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වියළි මිරිස් පිළිබඳව 1958 අගෝස්තු 19 වෙනි දින, අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 16 වෙනි දින, ඇම්. ඇල්. 1958/කේ වෙනි ආහාර මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡෙදයන් සහ 1 වෙනි උපලෙඛනය ද, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකිය යුතු ලෙසද, මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ඔක්තෝබර් මස 30 වෙනි දින පස්වරු 1.25 ට මාතලේදී අත්සන් තබන ලදී.

බන්දුල ඇස්. ද සිල්වා,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

### 2 වෙනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| විස්තර | කොට්ඨාශය | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| වියළි මිරිස් ... ... ... | 1 ... | 89 41 ... | 0 87 |
| | 2 ... | 89 61 ... | 0 88 |
| | 3 ... | 89 76 ... | 0 89 |
| | 4 ... | 90 16 ... | 0 90 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමෙ නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිල ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නො හැකිය.

---

අ. 46 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය
(වියලි මිරිස්)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැන්පත් දෙන් චාල්ස් ලයනල් අමරසිංහ වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 27 වෙනි දින, අංක 11,505 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1958 අගෝස්තු 23 වෙනි දින අංක 43 දරණ ආහාර මිල නියෝගයේ උපලේඛනයේ 1 වෙනි තීරයෙහි සඳහන් වියලි මිරිස් පිළිබඳව, එම උපලේඛනයෙහි 2 (i) සහ (ii) සහ 3 (i) සහ (ii) වැනි තීරයන්හි පිළිවෙළින් සඳහන්, තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළෙඳ මිලද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිලද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩර යක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, මේ උපලේඛනයේ 2 සහ 3 වෙනි තීරවල සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිල, මේ දුන් පටන්, මේ උපලේඛනයේ 2 (i) සහ (ii) සහ 3 (i) සහ (ii) වැනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව, 1958 අගෝස්තු 27 වෙනි දින අංක 11,505 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 23 වෙනි දින අ. 43 වෙනි ආහාර මිල නියෝගයේ 3 සිට 8 දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ඔක්තෝබර් 30 වෙනි දින දවල් 12 ට අනුරාධපුරයේ දී අත්සන් තබන ලදී.

ඩී. සී. ඇල්. අමරසිංහ,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැන.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | | 3 වැනි තීරය | |
|---|---|---|---|---|
| විස්තරය | 1. අංක 23 සී දරණ තුලාන ඇතුළත්ව අනුරාධපුර නගර සහා සීමාවන් සහ කැකිරාව සුළු නගර සහා සීමාවන් ඇතුළත | | 3. අනුරාධපුර නගර සහා සීමාවන්, අංක 23 සී දරණ තුලාන සහ කැකිරාව සුළු නගර සහා සීමාවන් හැර අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය ඇතුළත | |
| | (i) | (ii) | (i) | (ii) |
| | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| වියලි මිරිස් ... ... ... | 87 48 ... | 0 86 ... | 87 73 | 0 87 |

**සැළකිය යුතුයි.**—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමෙ නියමිත මිල නොවේ. මෙවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිල වේ. එකී මිලට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

කේ. ඊ. 43 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

කෑගලු දිසාවේ උප (ආහාර) මිළ පාලක තැන්පත් නාගමුත්තු පුලේන්දිරන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු අංක 4 දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 සැප්තැම්බර් 2 වෙනි දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1958 අගෝස්තු 27 වෙනි දින කේ. ඊ. 40 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳ ව එම උප ලේඛනයෙහි 2 වෙනි සහ 3 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිලද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොන්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද කෑගල්ල දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන්, මේ උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව සැප්තැම්බර් 2 වෙනි දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 27 වෙනි දින කේ. ඊ. 40 වෙනි ආහාර මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡේදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැලැකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ඔක්තෝබර් 31 වෙනි දින, පස්වරු 2ට කෑගල්ලේදී අත්සන් කරන ලදී.

නාගමුත්තු පුලේන්දිරන්,
උප (ආහාර) මිළ පාලක තැන.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| වියලි මිරිස් ... | 90 09 ... | 0 88 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.